# <u>මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු</u>

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලවල හා ර්ට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනවල **තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරි/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් **2018.09.27 වෙනි දින හෝ ර්ට පෙර ලැබෙනසේ ලේඛනගත තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි/ ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි එය සලකා බලනු නොලැබේ.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව වෘත්තීය/යෝග්‍යතා/ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ. තවද පහත සඳහන් තනතුරු සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2017 වර්ෂයේ වැටුප් ක්‍රමය අදාල වේ.

01. <u>යාන්ත්‍රික II ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම්:

(I) කියවීමට හා ලිවීමට හැකියාව තිබීම.

(II) පහත දැක්වෙන කරුණු පිළිබඳව හැකියාව තිබිය යුතුය.

(අ) පරිමාණයන් කියවීම, මයික්‍රොමීටර් සහ සූක්ෂම මාන සටහන් කියවීම.

(ආ) වාෂ්ප එන්ජින් යන්ත්‍ර සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණ වල විශේෂිත සවි කිරීම් වර්ග <u>හෝ</u> කර්මාන්තශාලා ලියවන පට්ටල්, මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩගාන යන්ත්‍ර ක්‍රියා කරවීමේ හැකියාව.

(ඇ) රූ සටහන් කියවීම හා තේරුම් ගැනීමේ හැකියාව.

(III) යාන්ත්‍රිකයෙකු හෝ යන්ත්‍ර ක්‍රියාකරවන්නෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් ක්‍රමය : රු.24,209-16x218-27,697/-(මාසික) U-PL 3(III)

02. **<u>කම්මල්කරු 11 ශ්‍රේණිය</u>**

01. අවශ්‍ය වෘත්තීය සුදුසුකම්:

(අ) ගිනියම් කළ පැස්සුම් වලින් විවිධ මාදිලියේ පිරිද්දුම් ගැන දැනීම.

(ආ) ගල් අඟුරු වැනි ඛනිජ වලින් ඇති කරන නොයෙක් විධියේ තාපක උපවර හා අත්හදා බැලීම් ගැන දැනීම.

(ඇ) පන්නරය තැබීම හා වානේ දුනු සෑදීමේ ක්‍රියාවලිය ගැන දැනීම.

(ඈ) කම්මල් කරු වෘත්තියේදී පාවිච්චි කරන උපකරණ යෙදවීමේ හැකියාව යන ආරක්‍ෂක කටයුතු ගැන දැනීම

02. අවුරුදු දෙකකට නොඅඩුව කම්මලක ලබා ඇති පළපුරුද්ද

වැටුප් ක්‍රමය රු.24,209-16x218-27,697/-(මාසික) U-PL 3(III)

ලේඛකාධිකාරි
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.
2018.09.10